| | | |
|---|---|---|
| මගේ අංකය<br>எனது இல<br>My No DDD/02/DPA/06/2015 | ඔබේ අංකය<br>உமது இல<br>Your No ........................ | දිනය<br>திகதி<br>Date 2021.09.24 |

සියළුම දිස්ත්‍රික් ලේකම්/ දිස්ත්‍රික් සමෘද්ධි අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන්,

දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ වරුන්,

ප්‍රාදේශීය ලේකම් වරුන්,

දිස්ත්‍රික් නියෝජ්‍ය/සහකාර අධ්‍යක්ෂ වරුන්,

සමෘද්ධි කළමනාකරුවන්, සංවර්ධන නිලධාරීන්

ඇතුළු කාර්ය මණ්ඩලයේ සියළුම නිධාරීන් වෙත.

**<u>සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවට අන්තර්ග්‍රහණය වන නිලධාරීන් වෙත දෙපාර්තමේන්තුව පිහිටුවීමට පෙර ලබාදුන් විනය නියෝගවලට එරෙහිව අභියාචනා ඉදිරිපත් කිරීම.</u>**

2017 අංක 2 දරන දිවිනැගුම (සංශෝධන) පනතින් සංශෝධිත 2013 අංක 1 දරන දිවිනැගුම පනත අනුව පිහිටුවන ලද සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවට ඒකාබද්ධ කරන ලද ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය, ශ්‍රී ලංකා දක්ෂිණ සංවර්ධන අධිකාරිය හා ශ්‍රී ලංකා උඩරට සංවර්ධන අධිකාරිය යන ආයතනවල සේවය කරමින් සිටිය දී පූර්ව විනය බලධාරීන් විසින් ලබාදෙන ලද විනය නියෝගයකින් අතෘප්තියට පත් නිලධාරියකුට රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත අභියාචනයක් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දීමට අංක අමප/21/0821/304/071 හා 2021.06.15 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය මගින් දන්වා ඇත.

02. එවැනි නිලධරයකුගේ අභියාචනා ආයතන සංග්‍රහයේ II කාණ්ඩයේ 3වන පරිශිෂ්ට වාර්තාව සමග මා මගින් හා අමාත්‍යාංශ ලේකම් මගින් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත 2021.09.15 දිනට පෙර ඉදිරිපත් කරන ලෙස රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම් ගේ අංක PSC/APL/1/COM/2021 හා 2021.07.26 දිනැති ලිපිය මගින් මටද පිටපත් සහිතව සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍රමූල්‍ය, ස්වයං රැකියා සහ ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම් වෙත දන්වා ඇත. ( මෙම කාලය තවත් මාස 03කින් දීර්ඝකර දෙන ලෙස මාගේ අංක DSD/HO/DPA/06/2016 හා 2021.09.09 දිනැති ලිපිය මගින් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙතින් ඉල්ලීම් කර ඇත.)

03. ඒ අනුව, පහත අවස්ථාවන්ට අදාල නිලධාරීන්ට 2021.11.25 දිනට පෙර තම අභියාචනය චෝදනා පත්‍රයේ හා විනය නියෝගයේ පිටපතක් සහිතව මා වෙත ඉදිරිපත් කළ හැකි බව කාරුණිකව දන්වමි.

I. සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව(මුලින් දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව) පිහිටුවන දිනට පූර්වාසන්න මාස 06 ඇතුළත අදාල අධිකාරි තුනෙහි සේවය කරමින් සිටිය දී ලබාදුන් විනය නියෝගයකින් අතෘප්තියට පත් නිලධරයෙකුට;

II. අදාල අධිකාරි තුනෙන් එකක පිහිටුවා තිබූ අභියාචනා කමිටුවක් වෙත අභියාචනයක් නියමිත කාලය තුළ දී ඉදිරිපත් කර ඇති බව සනාථ කළ හැකි හා එම අභියාචනය සම්බන්ධයෙන් අවසන් තීරණයක් ලබා දී නොමැති නිලධරයෙකුට;

III. කම්කරු විනිශවය සභාවක් වෙත අභියාචනයක් ඉදිරිපත් කර ඇති බව සනාථ කළ හැකි සහ මෙතෙක් අවසන් නියෝගයක් ලබා දී නොමැති හෝ දෙපාර්තමේන්තුව පිහිටුවීම හේතුවෙන් අභියාචනා විභාග කිරීම කම්කරු විනිශ්චය සභාව විසින් අත්හිටුවා ඇති නිලධරයෙකුට;

IV. යම් පටිපාටියක් හෝ විනය නීතියක් උල්ලංඝනය කිරීමකින් යම් අසාධාරණයකට ලක්ව ඇති නිලධරයෙකුට.

04. ඒ අනුව, ඉහත අවස්ථාවන්ට අදාල වන විනය නියෝගයකින් අතෘප්තියට පත් නිලධාරියෙකුට 2021.11.25 දිනට පෙර මා වෙත අභියාචනයක් ඉදිරිපත් කරන ලෙසත් ඉහත අවස්ථාවන්ට අදාල නොවන අභියාචනයන් මෙම තීරණය යටතේ සලකා නොබලන බැවින් එවැනි අභියාචනයන් ඉදිරිපත් කිරීමෙන් වළකින ලෙසත් අදාල සියළු නිලධාරින් වෙත උපදෙස් ලබා දෙන ලෙස කාරුණිකව දන්වමි.

05. තවද, පවතින කොවිඩ් වසංගත තත්ත්වය හමුවේ බාධාවකින් තොරව මෙම අවස්ථාව දැනුවත් කිරීම සඳහා ඔබ විසින් ගනු ලබන ක්‍රියාමාර්ගයන්ට අතිරේකව මෙම ලිපිය හෝ වෙනත් සුදුසු දැන්වීමක් දිස්ත්‍රික් හා ප්‍රාදේශීය සියළු සමෘද්ධි කාර්යාලවල, සියළු සමෘද්ධි බැංක හා සමෘද්ධි බැංකු සමිතිවල හා ග්‍රාමීය සමෘද්ධි කාර්යාලවල ද ප්‍රදර්ශණය කිරීම සුදුසු බව කාරුණිකව දන්වමි.

06. මේ පිළිබඳව දැනුවත් කිරීමට සුදුසු දැන්වීමක් ද මේ සමග එවා ඇත.

07. මේ අනුව, යම් සහනයක් බලාපොරොත්තු වන මෙම දෙපාර්තමේන්තුවට අන්තර්ග්‍රහණය වූ ආයතන වල නිලධාරීන් වේ නම්, එම නිලධාරීන් සම්බන්ධකර මෙම තොරතුරු ලබා දීමට ඔබ සැම දක්වන සහාය අතිශය අගය කරමි.

ආර්.පී.බී.තිලකසිරි
අධ්‍යක්ෂ ජනරාල්

පිටපත් :

1. අමාත්‍ය මණ්ඩලයේ ලේකම් - කා.දැ.ගැ.ස.
2. ලේකම්, රාජ්‍ය සේවා කොමිෂන් සභාව - කා.දැ.ගැ.ස.
3. ලේකම්, සමෘද්ධි ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය. - කා.දැ.ගැ.ස.
4. විගණකාධිපති - කා.දැ.ගැ.ස.
5. ප්‍රධාන අභ්‍යන්තර විගණක, සමෘද්ධි සංවර්ධන දෙ. - කා.දැ.ගැ.ස.
6. සියලුම අංශ ප්‍රධානීන් - අ.ක.ස.